## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/102 /2020 (PSC)

චතුර උමගිලිය
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.03**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රාජ්‍ය නිලධාරී තිස්ස ගුණතිලක මහතා
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම්.ජී.එච්.මධූෂා මිය.

**-නියෝගය-**

**ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය**

අභියාචක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විවෘත තරඟ විභාගය සමත්ව, 2006.10.02 දින රාජ්‍ය සේවයට එක්වී ඇත. විවිධ තනතුරු දරා ඇති අභියාචක, 2020.03.12 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉල්ලීමක් කරමින් තමාට සිදුවූ අසාධාරණයක් පිළිබඳව විසඳුමක් ඉල්ලා ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව හා ඉන් තෘප්තිමත් නොවීම මත, 2020.10.07 දින මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනයෙන් ඔහු ඉල්ලා සිටින්නේ,

A. **මාගේ පත්වීම් දිනය වන 2006.10.02 දින සිට මා රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලෙසට නියෝග කරන මෙන්,**

B. **කිසිදු දැනුම්දීමකින් තොරව, නීති විරෝධීව නවතා ඇති මාගේ වැටුප් වර්ධක සියල්ල හිඟ දීමනා සහිතව ලබාදෙන ලෙසට නියෝග කරන මෙන්,**

C. **රාජ්‍ය සේවකයෙකු ලෙස ගත වූ වසර 14ක කාලය තුළ මා හට සිදුවූ අසාධාරණයේ මූල්‍ය හානිය පූර්ණය කර ගැනීම**

**සඳහා (වාහන බලපත්‍ර ආදිය අහිමි වීමෙන්) රුපියල් මිලියන පහක වන්දියක් ලබාදෙන ලෙසට නියෝග කරන මෙන්,**

අදාළ සහනයන් ලබාදෙන ලෙසත් ය.

මෙම කරුණු සනාථ කරලීම සඳහා ඇමුණුම් රැසක් ඉදිරිපත් කර සිටී. එසේම 2026.04.22, 2025.11.28, 2024.02.14 දිනැති නිරීක්ෂණ සහ වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා ඇමුණුම් ඉදිරිපත් කර ඇත. විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි. මෙම කරුණු වලදී අභියාචක දන්වා සිටින්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මාලාවේ 96 වගන්තියට අනුව පත්වීම් ස්ථිර කිරීම, 108 වගන්තියට අනුව සේවය ස්ථිර කිරීම, 101 වගන්තියට අනුව පරිවාස කාලය තුළ සමාලෝචන වාර්තා සැකසීම, 104 වගන්තියට අනුව පරිවාස කාලය දීර්ඝ කිරීම පිළිබඳව දැනුම් දීම, 108 වගන්තියට අනුව ඒ පිළිබඳව දැනුම් දීම ආදිය සිදුකළ යුතු වුවත්, තමාට ඒ පිළිබඳව දැනුම් දීම් සිදුකර නැති බව සහ, ඒ නිසා තමාට අසාධාරණයක් සිදුවී ඇති බවයි.

මේ කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තම නිරීක්ෂණ 2021.11.12 හා 2025.12.03 දින වලදී ඉදිරිපත් කර ඇත. එම කරුණු සනාථ කිරීම සඳහා ඇමුණුම් රැසක් ඉදිරිපත් කර ඇත. එසේම විවෘත අධිකරණයේ දී වාචිකව පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි. අදාළ පැහැදිලි කිරීම් යටතේ 2025.12.03 නිරීක්ෂණ අනුව,

01. අභියාචක 2006.10.02 දින විවෘත තරඟ විභාගය යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III නිලධාරියෙකු ලෙස රාජ්‍ය සේවයට එක්වී ඇත.

02. 2005 වසරේ බඳවා ගැනීම් පටිපාටිය සහ ඉන් පසුව නව බඳවා ගැනීම් පරිපාටිය/ ඊට හඳුන්වා දුන් සංශෝධන යටතේ අභියාචකගේ පත්වීම පාලනය වේ.

03. අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ 9:1 යටතේ වසරක සීමාවාසික පුහුණු පාඨමාලාවක් සඳහා අභියාචක (SLIDA ආයතනය විසින් පවත්වන) සහභාගී විය යුතු අතර, ඉන් සමත් විය යුතුය.

(2005.11.14 බඳවා ගැනීමේ පරිපාටියේ පහත ඡේද අනුව)

9:

(1) ආධුනික පුහුණුව,

(අ) ආධුනික පුහුණුව ලේකම් විසින් සංවිධානය කොට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ හෝ වෙනත් උසස් පුහුණු කිරීමේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක් මගින් පවත්වනු ලබන රාජ්‍ය පරිපාලන පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් කරා යොමු වූ පාඨමාලාවකි. සේවයේ ස්ථිර කිරීම සඳහා මෙම පුහුණු සහතිකය ලබාගත යුතුය.

(ආ) පුහුණු කාලසීමාව තුළදී අධුනික නිලධාරීන් කළමනාකාරීත්ව ක්‍රමෝපායන් හා නිපුනතා අත්කර ගැනීමට සහාය වනු ඇත. ඔවුන්ට සිංහල හා දෙමළ යන රාජ්‍ය භාෂා දෙක සහ සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාවෙහි ප්‍රවීණත්වය ලබා ගැනීමට පුහුණුව මගින් සහාය වනු ලැබේ. එමෙන්ම තමන්

කළමනාකරුවන් වශයෙන් කටයුතු කිරීමට අපේක්ෂිත සමාජ, ආර්ථික හා සංස්කෘතික පරිසරයෙහි ඇතිවන සංවර්ධන ප්‍රවණතා පිළිබඳව ඔවුන්ට අවබෝධ කර දෙනු ලැබේ.

(ඈ) පුහුණු කාලය තුළදී ආධුනික නිලධාරීන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත අනුයුක්ත කරනු ලබන අතර, ඔවුන් එම ආයතනයේ අධීක්ෂණයට හා පාලනයට යටත් වන්නේ ය.

**10. සේවය ස්ථිර කිරීම.**

(1) විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III පන්තියට පත්කරනු ලබන නිලධාරියකු වසර 03ක පරිවාස කාලයකට යටත්වේ. ඔහු/ඇය පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම්, ඔහු/ඇය පරිවාස කාලය අවසානයේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ස්ථිර කරනු ලැබේ.

(2) සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත III පන්තියට පත්කරනු ලබන නිලධාරියකු එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය වැඩ බැලීමේ කාලය තුළ සිය රාජකාරී කටයුතු සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම්, වැඩ බැලීමේ කාලය අවසානයේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ස්ථිර කරනු ලැබේ. මෙම නිලධාරීන් පරිපාලන සේවයට පත්කිරීමෙන් අනතුරුව ලබන තුන්වන වැටුප් වර්ධකය උපයා ගැනීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(04) එයට අමතරව 2006.09.24 දින අභියාචකට ලබා දී ඇති පත්වීම් ලිපියේ පහත ඡේද අනුව,

(04) 2005 නොවැම්බර් මස 14 වන දින හා 1419/3 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් කර ඇත්තා වූ ද, මතුවට කරනු ලබන්නාවූ සංශෝධනයන්ට ද යටත්ව එම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් ඔබේ පත්වීම පාලනය වනු ඇත.

(06) 2006.10.02 දින සිට පුහුණුව සඳහා ඔබ, කොළඹ 07, මලලසේකර මාවතේ අංක 28/10හි පිහිටි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට අනුයුක්ත කරනු ලැබේ. ඔබගේ පත්වීම ක්‍රියාත්මක වන්නේ, ඔබ වැඩ භාරගන්නා දිනයේ සිටය. සේවයේ ස්ථිර කිරීම සඳහා

අවශ්‍යවන අනෙකුත් කරුණු වලට අමතරව ව්‍යවස්ථාවේ 9 වන ඡේදයෙහි (1) වගන්තිය යටතේ සඳහන් පුහුණු පාඨමාලාව අවසානයේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන පරීක්‍ෂණයෙන් ද ඔබ සමත්විය යුතුය.

14. 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 06/2006 හි අංක SL-1-2006 දරණ වැටුප් බණ්ඩය(මාසික) මෙම තනතුරට හිමිවන අතර, වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලවය. ඔබ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරෙහි පිහිටවනු ඇත. සේවයට පත්වීමේ දින සිට වසර තුනක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම ද, පත්වීමේ දින සිට වසර 06ක් ඇතළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත්විය යුතුය.

    අ. ඔබගේ පත්වීම ස්ථිර කරනු ලැබීමට පෙර, ඔබ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියට පත්කරන ලද නිලධාරීන් සඳහා වන පළමු වෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

16. ඉදින් පරිවාස කාලය තුළදී ඔබගේ සේවය සතුටුදායක වී නම් ද, එසේම ඔබ සිංහල හෝ දෙමළ භාෂාවේ නියමිත තත්ත්වයේ ප්‍රවීණතාවයක් ලබා ගෙන තිබේ නම් ද, මෙහි අංක 6, 14 ඡේදවල නියම කර ඇති කොන්දේසි සපුරා තිබේ නම් ද, එකී පරිවාස කාලය අවසානයේ දී ආයතන සංග්‍රහයේ II වෙනි පරිච්ඡේදයේ එකොලාස්වෙනි වගන්තිය යටතේ ඔබ තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

21. මෙම ලිපියෙහි සඳහන් සියළු කොන්දේසි යටතේ ඔබ මෙම පත්වීම භාර ගන්නෙහි නම්, ඒ බව 2006.10.18 දින හෝ ඊට පෙර රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මඟින් මා වෙත දන්වා එවන්න.

අභියාචකට ලබා දී ඇති මෙම පත්වීම් ලිපිය අනුව නියමිත කාලයක් තුළ සපුරා ගතයුතු සුදුසුකම් පැහැදිලිව දක්වා ඇත.

(05) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2015 ලිපිය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමට තවත් සහන සලසා දී ඇත.

(06) අභියාචක සේවා අවශ්‍යතා අනුව සමාරම්භක සේවාස්ථ පුහුණුව සපුරා නැත. 2019.12.12 SLIDA අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව.

(07) 2020.01.13 විභාග කොමසාරිස් ජනරාල් ලිපිය අනුව අභියාචක කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්කර නැති බව සනාථ වේ.

(08) 2008 - 2014 වසර සඳහාත්,

2015 - 2019 දක්වා වසර වලදී SLIDA ආයතනය මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ඇතත්, අභියාචක ඒ සඳහා ඉල්ලුම්කර ඇති බවක් දන්නට නොලැබෙන බව SLIDA/Fx/02/03/05 හා 2019.12.12 ලිපිය අනුව පැහැදිලිවේ.

(09) 2023.06.26 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) ලිපිය අනුව අභියාචක 2022.11.05 දින පැවැත්වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය අනුව විෂයන් 02 පමණක් සමත් වී ඇති බව සඳහන් වේ.

(10) SLIDA ආයතනයේ ලේඛකාධිකාරී ගේ 2013.01.24 දිනැති ලිපිය මඟින්, අදාළ පැවරුම් 10න් පැවරුම් 5 සඳහා නිබන්දන ඉදිරිපත් කර නැති බව සහ එය ඉදිරිපත් කරන ලෙස දැනුම් දීම සිදුකර ඇත.

(11) රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින්, ලේකම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට යැවූ, (තවත් අයට පිටපත් සහිතව) 2020.09.18 දිනැති ලිපියේ 03 ඡේදය අනුව,

"03. ඒ අනුව නිලධාරියාගේ ඉල්ලීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත තීරණ ලබා දී ඇති බව එහි නියමය පරිදි කාරුණිකව දන්වමි.

i. 2019.08.22 දිනැති ලිපිය මඟින් සේවය ස්ථිර කරනු ලැබීම සහ විලම්භනය කර ඇති වැටුප් වර්ධක ලබා දීම සම්බන්ධයෙන් නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට.

ii. 2015.11.14 දිනැති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1419/3 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවෙහි සහ නිලධාරියා වෙත නිකුත් කරනු ලැබ ඇති පත්වීම් ලිපියෙහි විධිවිධාන ප්‍රකාරව සේවය ස්ථිර කරනු ලැබීමට අදාළ වන සියළු අවශ්‍යතා, මෙම නියෝගය දැනුම් දුන් දින සිට වසර දෙකක කාල සීමාවක් ඇතුළත සම්පූර්ණ කරන ලෙසත්, එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, නිලධාරියාගේ පත්වීම අවසන් කිරීමට සිදුවන බවත් උමගිලිය මහතා වෙත දැනුම් දෙන ලෙස ඔබට දන්වීමට.

iii. ඒ අනුව 2009.10.02 දින සිට මෙම නියෝගයෙන් වසර 02 කට පසු එළඹෙන දින දක්වා නිලධාරියාගේ පරිවාස කාලය තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 111 වගන්තිය ප්‍රකාරව දීර්ඝ කිරීමට.

iv. රජයේ නිලධාරීන්ගේ පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීමට අදාළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි, VIII වැනි පරිච්ඡේදයෙහි සඳහන් විධිවිධාන අනුව පරිවාස කාලය තුළ සිටින නිලධාරියෙකුගේ සේවය ස්ථිර කිරීම

සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරයට අනුව සී.එන්.උමගිලිය මහතා සම්බන්ධව සුදුසු පියවර ගන්නා ලෙස ඔබට දැන්වීමට.

v. උමගිලිය මහතාගේ පෞද්ගලික ලිපි ගොනුව අස්ථානගතවීම සම්බන්ධව පවත්වනු ලබන මූලික විමර්ශනයේ කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස අදාළ බලධාරීන් දැනුවත් කරන ලෙස ඔබට දැන්වීමට.”

රාජ්‍ය සේවා කොමිෂම විසින් පැහැදිලි නියෝග ලබා දී ඇත. අදාළ නියෝගය අනුව අභියාචක කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා **2022** වසරේ පෙනී සිට ඇති අතර, විෂයන් **02** සමත්ව ඇත.

මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ, අභියාචක, පරිපාලන සේවයේ නිලධාරියෙකු ලෙස හා නීතිඥවරයෙකු ලෙස පත්වීම් ලිපිය සහ බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන්, තමා විසින් ඉටුකළ යුතු කොන්දේසි ඉටු නොකර, අනිකත් පාර්ශව වල අඩුපාඩු ප්‍රකාශ කරන බවය. එය, වැදගත් තනතුරක් දරණ පරිපාලන සේවයේ නිලධාරයෙකුට සුදුසු නොවන අතර, සාමාන්‍ය රාජ්‍ය සේවයේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් නිර්මාණය කරනු ඇත. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා දී ඇති තීරණයෙහි වෙනසක් සඳහා මෙම අධිකාරය මැදිහත් වීමට අපේක්ෂා නොකරමු. අභියාචකගේ ඉල්ලීමේ C යටතේ සඳහන් වන්දි ලබා දීමට මෙම විනිශ්චය අධිකාරයට නීතිමය හැකියාවක් නොමැති බවද වැඩිදුරටත් දන්වා සිටිමු. අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු. මෙම තීරණය අභියාචක, ලේකම්, රාජ්‍ය පරිපාලන හා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-